රුහුණ විශ්වවිද්‍යාලය

**2016/2017 ශාස්ත්‍රවේදී (සාමාන්‍ය/ විශේෂ) උපාධි - 3000 ස්ථලය**
**දෙවන සමාසික පරීක්ෂණය - 2018 මැයි**

**SLS 32523/ 32623 – නූතන සිංහල ප්‍රබන්ධකතා**

<u>එක් කොටසකින් ප්‍රශ්න දෙකක්වත් (02) තෝරාගෙන ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.</u>

අපැහැදිලි අත්අකුරුවලට ලකුණු අඩු කෙරේ.

**කාලය : පැය 03 යි.**

---

<u>'අ' කොටස</u>

01. නවකතාව සම්බන්ධ 'නවීනත්වය' යන සංකල්පය පිළිබඳ සංක්ෂේප සටහනක් කොට එය අද්‍යතන නවකතාවෙහි කොතෙක් දුරට විද්‍යමාන වන්නේ දැ යි නිරීක්ෂණය කරන්න.

02. ධර්ම ප්‍රචාරය, සමාජ සංශෝධනය සහ දේශ වාත්සල්‍යය යන කාරණා මුල්කාලීන සිංහල ගද්‍ය ආඛ්‍යානවල සුලබ ව දක්නට ලැබුණේ කුමන හේතු කාරණා නිසා දැ යි පරීක්ෂා කරන්න.

03. නවකතාවක් ආශ්‍රිත ව ගොඩනැගෙන සංකථන පුද්ගල චින්තනය හැඩගැස්වීමෙහි ලා උපස්ථම්භක වන ආකාරය මුල් කාලයේ සිංහල නවකතා ඇසුරෙන් පැහැදිලි කරන්න.

04. ප්‍රබන්ධකරණයේ දී චරිත නිරූපණය සහ සිද්ධි නිරූපණය යන සංකල්ප අතරින් ප්‍රමුඛ වන්නේ කවර සංකල්පය දැ යි ඔබට අභිමත කෙටිකතා දෙකක්වත් (02) ඇසුරෙන් පරීක්ෂා කරන්න.

## 'ආ' කොටස

05. "සමාජ ආශ්‍රයට මැලිවන්නා වූ ද, හුදෙකලා බව ප්‍රිය කරන්නා වූ ද, චරිත උත්කර්ෂයෙන් ඉදිරිපත් කිරීම සාන්දෘෂ්ටිකවාදී සාහිත්‍යයේ ලක්ෂණයකි." විරාගය නවකතාව ඇසුරෙන් විවරණය කරන්න.

06. 'හැත්තෑවේ කොලණිය' නවකතාවේ චරිත හා සිද්ධි සමග පසුබිම/පසුතලය ඓන්ද්‍රීයව බද්ධවන අයුරු නිදර්ශන සහිත ව පැහැදිලි කරන්න.

07. "සුදු සෙවණැලි නවකතාව වූ කලී ඉංග්‍රීසි ආධිපත්‍යයේ ව්‍යාප්තියත් සමග ජන ජීවිතයේ සිදු වූ ආර්ථික, දේශපාලන හා අධ්‍යාපනික පරිවර්තනය චිත්‍රණය කරන්නකි." පක්ෂ ව හෝ විපක්ෂ ව අදහස් දක්වන්න.

08. යම් ප්‍රබන්ධයක සඳහන් වර්තමාන සහ අනාගත සිදුවීම් යථානුරූපී ව නිරූපණය වීම උදෙසා අතීතාවර්ජන රචනෝපක්‍රමය කෙතෙක් දුරට උපකාර වන්නේ දැ යි නිර්දිෂ්ට කෙටිකතා ඇසුරෙන් විමසන්න.

(එක් පිළිතුරකට ලකුණු 12 බැගින්)

@@@@@@@@@